**වී අලෙවි මණ්ඩලය - 2018**

**-------------------------------**

## 1.1 මතය වියාචනය

**------------------**

වී අලෙවි මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

මාගේ වාර්තාවේ මතය වියාචනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 1.2 මතය වියාචනය සඳහා පදනම

**--------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මතය වියාචනය සඳහා පදනමක් සැපයීම උදෙසා ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**-------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4. විගණන විෂය පථය

**---------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක

අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාචෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව,මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

---------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද ”අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත සඳහන් මාතෘකා යටතේ ඇතුළත් කර ඇත.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

---------------------------------------------------------

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 07** | | |
| (i) සමාලෝචිත වර්ෂයේ බිම්රාක්ක (පැලට්) මිලදීගැනීම වෙනුවෙන් මණ්ඩලය විසින් මුදලින් ගෙවා තිබුණේ රු.11,010,650 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වල රු.5,395,090 ක්වූ ගෙවිය යුතු ශේෂයද ඇතුළුව පැලට් මිලදීගැනීම් ලෙස රු.16,405,740 ක් ලෙස දක්වා තිබුණි. | ඉදිරියේදී ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව නිවැරදිව කටයුතු කිරීමට නිලධාරින්ට උපදෙස් ලබා දෙන ලදි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) සමාලෝචිත වර්ෂයේ කෙරීගෙන යන වැඩ සඳහා රු.63,335,231 ක් ගෙවා තිබුණද එය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.44,101,692 ක මුදල් ගලා යාම් ලෙස දක්වා තිබුණි. | ඉදිරියේදී ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව නිවැරදිව කටයුතු කිරීමට නිලධාරින්ට උපදෙස් ලබා දෙන ලදි. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

| | | |
|---|---|---|
| මෙම ප්‍රමිතයේ 51 ඡේදය අනුව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.4,654,646 ක්වූ ලොරි රථය 2014 වර්ෂය වන විට සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුනි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි | වත්කම් ප්‍රත්‍යාගණනයක් සිදු කර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සිදු කරමින් පවතී. | ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 වර්ෂයේ මණ්ඩලය විසින් සිදු කළ තොග සත්‍යාපනයේදී හඳුනාගත් රු.3,047,107,163 ක්වූ තොග ඌණතාවය විස්තීරණ ආදායම් ප්‍රකාශනයට ගැලපිය යුතු වුවද, එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වෙළඳ ණයගැතියන් යටතේ සටහන් කිරීම හේතුවෙන් අලාභය එම වටිනාකමින් අඩුවෙන් දැක්වුනි. | පිළිතුරු ලබාදී නොමැත. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) රු.353,190 ක්වූ පාලම් තරාදි සේවා ගාස්තු ඍජු පොදුකාර්ය වියදම් ලෙස ගිණුම්ගත කළ යුතු වුවද එය පරිපාලන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

## 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| බැංකු ශේෂය | 153,792,930 | 45,000 | 157,747,950 | ශේෂ විචලනය සම්බන්ධයෙන් බැංකුවෙන් අදාල තොරතුරු ලබා ගෙන නිවැරදි කිරිමට කටයුතු යොදා ඇත. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කල යුතු වීම |
| තොග භාරකරුව න්ගෙන් ලැබිය යුතු තොග ඌණතාවය | 6,615,555 | 5,903,501 | 712,054 | පළමුවර ශේෂය ගණනය කිරිමේදි දෝෂයක් සිදු වී ඇති අතර එය පසුව වාර්තා කිරිමේදි නිවැරදි වාර්තා කර ඇත. ඒ අනුව නිවැරදි ගණනය කිරිම වශයෙන් රු. 5,903,501 ලෙස සලකා ක්‍රියා කර ඇත. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කල යුතු වීම |
| සමුපකාර තොග වෙළද සංස්ථාවෙ න් අයවිය යුතු | 1,467,190,102 | 1,070,666,192 | 396,523,910 | පිළිතුරු ලබාදී නොමැත. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කල යුතු වීම |
| සමුපකාර තොග වෙළද සංස්ථාවට ගෙවිය යුතු ශේෂය | 1,202,897 | 85,711,719 | 84,508,822 | පිළිතුරු ලබාදී නොමැත. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කල යුතු වීම |

### 1.5.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | වටිනාකම | නොසැපයූ සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | හඳුනා නොගත් වී මිලදී ගැනීම් | 63,980,963 | | | |
| (ආ) | ගැනුම් පාලන ගිණුම | 49,743,530 | විස්තරාත්මක තොරතුරු ශේෂ සනාථ කිරීම් | පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ | ගිණුම් විෂයන්හි වටිනාකම් තහවුරු කර ගැනිම සඳහා අවශ්‍ය සාක්ෂි පවත්වාගෙන යා යුතුය. |
| (ඇ) | Rice Millers ණයට විකුණුම් | 44,399,804 | | | |
| (ඈ) | ලංකා බැංකුවෙන් ලැබිය යුතු ශේෂය | 3,282,807 | | | |
| (ඉ) | මහජන බැංකුවෙන් ලැබිය යුතු ශේෂය | 1,691,330 | | | |
| (ඊ) | ලංකා සතොස | 77,526,708 | | | |
| (උ) | අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතු | 2,458,086 | ශේෂ සනාථ කිරීම් | | |
| (ඌ) | හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ලැබිය යුතු | 18,351,743 | | | |
| (එ) | අමාත්‍යාංශයෙන් ලැබිය යුතු | 296,842,875 | | | |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට රු.2,748,583,551 ක්වූ ණයගැති ශේෂය තුල වසර 5 කට වැඩි රු.1,526,262,593 ක්, වසර 3 ත් වසර 5 ත් අතර රු.409,217,648 ක්, වසර 1 ත් වසර 3 ත් අතර රු.813,103,310 ක ශේෂ විය. මෙම ශේෂ අයකර ගැනීමට මණ්ඩලය විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2018 දෙසැම්බර් 31 වන දිනට වසර 1ත් වසර 3ත් අතර පැවති ශේෂය රු.813,103,310 ක්වූ අතර සතොස ආයතනය මඟින් රු. මිලියන 75 ක් ලබා දීමෙන් මෙම ශේෂය රු.738,103,310 ක් දක්වා පහළ ගොස් ඇත. වසර 05 කට වැඩි රු.1,526,262,593 ක් වූ ශේෂය රු.3,094,578 ක් ලැබීම මත රු.1523,168,014 දක්වා අඩු වී ඇත. | ණය ගැති ශේෂ අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණය ගැති ශේෂ යටතේ දක්වා තිබුණු ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු.425,951,745 ක් හා රු.10,591,838 ක ශේෂ සහ තල් සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු රු.700,000 ශේෂය සම්බන්ධයෙන් ලැබී තිබුණු ශේෂ සනාථ කිරීම් අනුව එවැනි ණය ගැති ශේෂ නොමැති බව එම ආයතනවලින් ලිඛිතව තහවුරු කර තිබුණි. | පිළිතුරු ලබාදී නොමැත. | ශේෂ නිවැරදිව තහවුරු කරගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |
| (ඇ) | 2018 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැති ශේෂ යටතේ දක්වා තිබුණු සමුපකාර තොග වෙළඳ සංස්ථාවෙන් අයවීමට පවතින රු.1,467,190,102 ශේෂය එම ආයතනයේ ශේෂ සනාථ කිරීම් අනුව රු.1,070,666,192 ක් බව තහවුරු කර තිබුණු අතර ඒ අනුව එම ශේෂ අතර රු.396,523,910 ක වෙනසක් පැවතුනි. | පිළිතුරු ලබාදී නොමැත. | ශේෂ නිවැරදිව තහවුරු කරගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට රු.6,971,705,394 ක්වූ ණයහිමි ශේෂය තුල වසර 4 කට වැඩි රු.281,665,114 ක්, වසර 3 ත් වසර 4 ත් අතර රු.6,434,633,563 ක්, වසර 1 ත් වසර 3 ත් අතර රු.5,378,637 ක් හා අවුරුදු 1 ට අඩු රු. 250,028,080 ක ශේෂ විය. මෙම ශේෂ තුළ භාණ්ඩාගාරයට ගෙවිය යුතු රු.6,684,554,538 ක් වූ අතර එම ශේෂ 2019 නොවැම්බර් 30 දින දක්වාම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | වී අලෙවි මණ්ඩලය සතුව ණය පියවීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන නොමැති අතර අංක 18/0526/732/007 හා 2018.03.31 දිනැති අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇති පරිදි වී අලෙවි මණ්ඩලය විසින් රාජ්‍ය බැංකු පියවිය යුතු බැංකු ණය දීර්ඝකාලින ණයක් ලෙස කපා හැරීමට මහා භාණ්ඩාගාරය මඟින් කටයුතු සිදු කිරීම සඳහා හා සහල් නිෂ්පාදන ක්‍රියාවලිය මඟින් ලාභ උපයා පවතින ණය ශේෂයන් පියවීමට පියවර ගැනීමට බලාපොරොත්තු වේ. | ණයහිමිශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

**1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)2016 සැප්තැම්බර් 19 දිනැති අංක 1/2016/(i) දරන ජාතික අයවැය චක්‍රලේඛය | සභාපති නිල රාජකාරි සඳහා කුලී රථ සම්බන්ධයෙන් උපරිම මාසික කුලිය ලෙස රු.200,000 ක් ලෙස දක්වා තිබුණද එම උපරිම මාසික කුලී සීමාව ඉක්මවා අනුමැතියකින් තොරව රු.848,800 ක් ගෙවා තිබුණි. | ආයතන ප්‍රධානියා සහතික වීම සහ අනුමැතිය යටතේ ගෙවීම් සිදු කර ඇත. | ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ)2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 1/2015 | සභාපති නිල වාහනය සඳහා මාසික ඉන්ධන දීමනාව ප්‍රමාණවත් නොවන විශේෂ අවස්ථාවකදී අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශ | එකඟ වේ. | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සහිතව අදාල රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත් එසේ අනුමැතියෙන් තොරව රු.482,285 ක් ගෙවා තිබුණි. | | |
| (ඇ)2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | 2016, 2017 හා 2018 වර්ෂයන්ට අදාල වාර්ෂික වාර්තා විගණිත දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2016 වාර්ෂික වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරිම සඳහා අමාත්‍යාංශයේ අනුමැතිය ලැබී ඇත. 2017 වාර්ෂික වාර්තාව දෙමළ භාෂාවට හා ඉංග්‍රිසි භාෂාවට පරිවර්තන කිරිමේ කටයුතු සඳහා ඉදිරිපත් කර ඇත. 2018 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව සකස් කරමින් පවති. | වාර්ෂික වාර්තා නියමිත කාලසීමාව තුල පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් අලාභය රු.1,185,101,723 ක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ මෙහෙයුම් අලාභය රු.462,105,320 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අලාභයෙහි වැඩිවීම රු.722,996,403 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.7,393,955,928 කින් අඩුවීම හා පරිපාලන වියදම් රු.46,576,479 කින්ද මූල්‍ය වියදම් රු.85,057,531 කින් වැඩි වුවද, විකුණුම් පරිවැය රු.6,732,090,785 කින් අඩුවීමත් වෙනත් ආදායම් රු.25,376,291 කින් වැඩි වීම ඉහත අලාභය වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**3.1 අනාර්ථික ගනුදෙනු**

----------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂය සඳහා මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කෘෂිකර්ම, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධිවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් 2019 ජූලි 05 දින ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයට අංක MF/PE/CM/2019/145 දරන හා 2019 අගෝස්තු 05 දින මුදල් අමාත්‍යවරයා විසින් ලබාදී තිබුණු නිර්දේශ අනුව ක්‍රමානුකූල තොග පාලන පද්ධතියක් කඩිනමින් සථාපිත කළ යුතු බව දක්වා තිබුණද මණ්ඩලය විසින් 2013 වර්ෂයේදී ආරම්භ කළ තොග පාලන පද්ධතියේ කටයුතු තවමත් අවසන් කර නොතිබුණි. 2019 නොවැම්බර් 15 දින වන විට මෙම පද්ධතිය ස්ථාපිත කිරීමේ කටයුතු සඳහා රු.18,328,337 ක් හා ඒ වෙනුවෙන් වූ VPN (Vertical Private Network) ගාස්තු සඳහා 2016, 2017 හා 2018 වර්ෂවලදී එකතුව රු.4,792,595 ක්ද වැය කර තිබුණි. 2019 අගෝස්තු 20 දින මණ්ඩලය විසින් නැවත පරිගණකගත තොග පාලන පද්ධතියක් සථාපිත කිරීම සඳහා ශ්‍රී ලංකා පදනම් ආයතනය සමඟ ගිවිසුම්ගතවී තිබූණු අතර ඒ සඳහා අත්තිකාරම් වශයෙන් රු.360,000 ක් ගෙවා තිබුණි. ඒ අනුව 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වැය කළ රු.23,120,932 නිශ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නැත. | අදාල පද්ධතිය කඩිනමින් ස්ථාපිත කිරිමට කටයුතු කල යුතුය. |

## 3.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2012 වර්ෂයේදී ක්‍රියාත්මක වූ සහල් අපනයන වැඩසටහන සඳහා මණ්ඩලය විසින් මිලදී ගන්නා ලද වී තොග පෞද්ගලික වී මෝල් හිමියන්ට ලබා දී සහල් කර නැවත මණ්ඩලයට ලබාදීමේ කොන්දේසි වලට යටත්ව වී තොග නිකුත් කර තිබුණි. කොන්දේසි ප්‍රකාරව සහල් භාර නොදුන් මෝල්හිමියන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 143,735,794ක් අයකර ගැනීම සඳහා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත 2014 නොවැම්බර් 21 දින පැමිණිලි කර තිබුණද විගණිත දිනය වන විටත් එම මුදල් අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. තවත් මෝල්හිමියන් 04 කුගෙන් අයවිය යුතු රු.2,545,126 ක් වාරික වශයෙන් අය කර ගැනීමට 2017 හා 2018 වර්ෂවලදී ගිවිසුම්වලට එළඹ තිබුණද එම එකඟ වූ පරිදි එම මුදල් අයවී නොතිබුණි. ගිවිසුම්වල හා ලිපිලේඛනවල අඩුපාඩුකම් හේතුවෙන් මෝල්හිමියන් 25කුගෙන් අයවිය යුතු රු.45,485,788 ක් අයකර ගැනීමට එම මෝල්හිමියන්ට විරුද්ධව නඩු පැවරීමට නොහැකි වී තිබුණු අතර තවත් මෝල්හිමියන් 06 කු වෙතින් අයවිය යුතු රු.16,181,975 ක් අය කර ගැනීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | 2017.08.21 වන දින, 2018.04.04 වන දින, 2019.07.01 දින සහ 2019.09.02 වන දින ලිපි යවමින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙතින් විමසා සිටිය ද ඔවුන් විසින් අප වෙත කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොමැත.<br>ගිවිසුම්වල සහ ලිපි ලේඛනවල අඩුපාඩුකම් පවතින වී මෝල් හිමියන් 25 දෙනෙකු අයකර ගත යුතු මුදල් අය කර ගැනීමට නීතිමය පියවර ගැනීම සඳහා මේ වන විට ලිපිගොණු සකස් කරමින් පවතී.<br>නඩු පැවරීම සඳහා නිසි පරිදි සම්පූර්ණ කරන ලද ලිපිගොණු 06 ක් මූලික පොලිස් පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා අම්පාර ප්‍රාදේශීය කාර්යාලය වෙත යොමු කර ඇත. | මෝල්හිමියන්ගෙන් අයවිය යුතු ශේෂ අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) පෞද්ගලික වී මෝල් හිමියන් වෙත ණය පදනම මත වී තොග නිකුත් කිරීමට සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්ගේ 2011 අගෝස්තු 22 දිනැති හා CTT/5/6/1/1 අංක දරන ලිපියෙන් අනුමැතිය ලබා දී තිබුණි. වී මෝල් හිමියන්ට වී තොග නිකුත් කිරීමේදී එළඹ තිබුණු ගිවිසුම්හි 2.1 වගන්තිය ප්‍රකාරව වී තොග නිකුත් කළ දින සිට දින 60 ක් ඇතුළත මුදල් ගෙවිය යුතු බව සඳහන් වුවද, වී තොග නිකුත් කර මේ වන විට වසර 09 කට අධික කාලයක් ගත වී ඇතත් මෝල්හිමියන් 9 දෙනෙකුට නිකුත් කළ වී කිලෝ 2,900,000 ක් සඳහා රු. 69,955,341 ක් අයවීමට පැවතුනි. විගණිත දින වන 2019 නොවැම්බර් 15 දින වන විටත් මෙම මුදල් අයකර ගැනීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි. | පෞද්ගලික වී මෝල් හිමියන් වෙත ණය පදනම මත වී තොග නිකුත් කිරීමට අදාල මෝල් හිමියන් 09 දෙනෙකුට අදාලව ලිපි ගොණු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇත. තව ද මෙම වැඩ සටහනට මූලිකව කටයුතු කළ එවකට සාමාන්‍යාධිකාරී අත්අඩංගුවට ගෙන කොටුව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරා ඇත. ඉදිරි නඩු කටයුතු සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | වී මෝල් හිමියන්ගෙන් අයවිය යුතු ශේෂ අයකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ)2017 වර්ෂයේදී මණ්ඩලය විසින් රු.8,970,000 ක් වැය කරමින් කිලිනොච්චිය, නිකවැරටිය හා අම්පාර ප්‍රදේශවල පාලම් තරාදි 03 ක් ඉදිකර තිබුණි. 2019 නොවැම්බර් 15 දින වන විට පාලම් තරාදි ඉදිකර වසර 02 අධික කාලයක් ගත වුවද මෙම පාලම් තරාදිය බර කිරීම සඳහා යොදාගෙන නොතිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2 වැනි පරිච්ඡේදය 2.3.1 (අ) අනුව ආරම්භක පාරිසරික හා සමාජීය බලපෑම් සලකා බැලිය යුතු බව දන්වා තිබුණද එම කරුණු ගැන අවධානය යොමු නොකිරීම හේතුවෙන් කිලිනොච්චිය ආර්ථික මධ්‍යස්ථානය තුල ඉදි කර තිබුණු පාලම් තරාදිය එම ආර්ථික මධ්‍යස්ථානය | මෙම පාලම් තරාදි ඉදි කිරීමේ ශක්‍යතා අධ්‍යනයකින් තොරව සිදු කර ඇති බැවින් මේ සම්බන්ධව ක්‍රියා කර ඇති ආකාරය පිළිබඳව විමර්ශනයක් සිදු කරමින් පවති. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2 වැනි පරිච්ඡේදය 2.3.1 අනුව කටයුතු කල යුතු අතර මෙම පාලම් තරාදි ප්‍රයෝජනයට ගැනීමේ වැඩ පිළිවෙලින් සකස් කළ යුතුය. |

| | | |
|---|---|---|
| ක්‍රියාත්මක නොවීම හේතුවෙන්ද, අම්පාර ඉදිකර තිබූ පාලම් තරාදියට පිවිසෙන මාර්ගයේ ලොරිරථ ගමන් කිරීමට නොහැකිවීම නිසා භාවිතයට ගැනීමට නොහැකි වී තිබුණි. | | |
| (ඇ) මණ්ඩලය සතුව පැවති ගබඩා 11 ක් සී/ස ලංකා පොහොර සමාගම වෙතද ගබඩා 05 ක් සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම වෙතද දෙපාර්ශවය අතර බදු ගිවිසුමකින් තොරව ලබා දී තිබුණු අතර එම සමාගම් වෙතින් කිසිදු බදු මුදලක් විගණිත දින වන විට අයවී නොතිබුණි. තවත් ගබඩා 07 ක් පෞද්ගලික ආයතන වෙත බදු පදනම මත ලබාදී තිබුණු අතර අදාල බදු කාලසීමාව 2007, 2009, 2010 හා 2011 වර්ෂ වලදී අවසන්ව පැවතියද නව බදු ගිවිසුම්වලට එළඹ නොතිබුණි. එසේ වුවද, එම ආයතන තවදුරටත් ගබඩා පරිශ්‍ර භාවිතා කරමින් පැවති අතර 2019 නොවැම්බර්15 දිනට එම ආයතනවලින් ලැබියයුතු හිඟ කුලිය රු.3,749,288 ක් විය. | සමාගම ලාභ ඉපයීමේ පරමාර්ථයෙන් තොරව රජයේ සහනාධාර පොහොර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ගොවිජන මධ්‍යස්ථාන හරහා ගොවීන් වෙත පොහොර බෙදා හැරීමේ කර්තව්‍යයෙහි නිරතව සිටින බවත්, දැනට බදු කුලී ගෙවීමට හැකියාවක් නොපවතින බවත් දන්වා සිටින ලදී. | ගබඩා බදු දීමේදී නිසි බදු ගිවිසුම් වලට එළඹිය යුතු අතර නියමිත කාල සීමාව අවසන් වූ බදුහිමියන් සම්බන්ධයෙන් බදු ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් ප්‍රධාන රාජ්‍ය බැංකු දෙකක් වෙත ගෙවිය යුතු ණය ශේෂය රු.11,419,664,165 ක් හා එම පොලිය රු.1,227,689,922 ක් වූ අතර බැංකු අයිරාව රු.269,849,649 කි. එවැනි ණය ශේෂ පැවතියදී සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මණ්ඩලය සතුව රු.377,702,910 ක්වූ ඉතිරි කිරීමේ ශේෂයක්ද, එකතුව රු.283,674,369 ක්වූ බැංකු ජංගම ගිණුම් 02 ක ශේෂයක්ද පැවති අතර එම ශේෂ වලින් රාජ්‍ය බැංකු වෙතින් ලබාගෙන | රජය අපේක්ෂා කරනුයේ වී අලෙවි මණ්ඩලය මඟින් ගොවියාත් පාර්භෝගිකයාත් තෘප්තිමත් වන ආකාරයට රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සිදු වන අතර ඇතැම් රජයේ ප්‍රතිපත්ති යටතේ ක්‍රියාත්මක කරන වැඩසටහන් මඟින් පාඩු ලැබීමට සිදු වේ.<br><br>මෙම මුදල් පියවීම සම්බන්ධව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති අතර එහි තීරණය දක්වා ඇත්තේ මහා භාණ්ඩාගාරය මඟින් දීර්ඝ කාලීන සැලැස්ම මත පදනම්ව වී අලෙවි මණ්ඩලය විසින් | ඉතිරිකිරීමේ ගිණුමේ ශේෂය හා ජංගම බැංකු ගිණුමේ ශේෂය ප්‍රතිලාභයක් ලැබෙන පරිදි ආයෝජනය කිරීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| තිබුණු ණය පියවීම සඳහා කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය බැංකු වෙත පියවිය යුතු ණය මුදල් ආපසු ගෙවීමට කටයුතු කළ යුතු බවය. වී අලෙවි මණ්ඩලය සතුව මෙම ණය මුදල් හා පොළී පියවීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය ස්ථාවරත්වයක් නොමැති බැවින් උක්ත කැබිනට් තීරණය ක්‍රියාත්මක කර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් අමාත්‍යාංශය ලේකම් දැනුවත් කරමින් ඉල්ලීම් කර ඇත. | |
| (ඊ) මණ්ඩලය විසින් ඉදිරිපත් කළ 2018 මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ සමුච්චිත අලාභය රුපියල් මිලියන 1,185.1 ක් විය. 2018 වර්ෂයේ මණ්ඩලයේ සෘණ ශුද්ධ වත්කම් ප්‍රමාණය 2017 වසරට සාපේක්ෂව රුපියල් මිලියන 13,266.65 දක්වා එනම් රුපියල් මිලියන 717.96 කින් වැඩිවී තිබුණි.ඒ අනුව භාණ්ඩාගාරයේ මූල්‍ය අනුග්‍රහයක් නොමැතිව ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමට නොහැකි තත්ත්වයක් පැවතුනි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | අවම භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ මණ්ඩලයේ කටයුතු පවත්වාගෙන යායුතු වීම. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ සිදුකළ වී තොග සත්‍යාපනයේදී හඳුනා ගත් තොග ඌණතාවය කිලෝ ග්‍රෑම් 85,933,454 ක්වූ අතර එහි වටිනාකම රු.3,047,107,163 කි. ඉන් ඉඩදිය හැකි තොග අඩුමාන ප්‍රමාණය හැර ඉතිරි ඌණතාවයන්ට සම්බන්ධ තොග භාරකරුවන් හඳුනාගෙන අදාල වටිනාකම් ඔවුන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | තොග අඩුමාන විමර්ශන කමිටුවක් පත්කොට තොග ඌනතාවයන් පිළිබඳ විමර්ශන කටයුතු ආරම්භ කර ඇති අතර විමර්ශනයන්ගෙන් පසුව ඉඩදිය හැකි තොග අඩුමාන ප්‍රමාණයන් හැර ඉතිරි ඌනතාවයන් තොග භාරකරුවන්ගෙන් අධිභාර කර අයකර ගැනීමට ක්‍රියා කරනු ඇත. | තොග ඌනතාවයන්ට වගකිව යුතු තොග භාරකරුවන් හඳුනාගෙන අදාල වටිනාකම් ඔවුන්ගෙන් අයකර ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. |